# ලංසු කැඳවීමේ ආරාධනාවයි

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව**
**පැලවත්ත, බත්තරමුල්ල**

## විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම

1. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත විස්තර සඳහන් විද්‍යාගාර උපකරණ ප්‍රසම්පාදනය වෙනුවෙන් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

**2. විද්‍යාගාර උපකරණ හා සේවාවන් පිළිබඳ විස්තර**

| අංකය | ටෙන්ඩර් අංකය | විස්තරය | ලංසු සුරක්ෂණය (රු.) |
|---|---|---|---|
| I | GAD/ACC11/2025/EQD/14 | Supply, Installation, Testing, Training & Maintenance of Brand New Forensic Document Examination Workstation | 700,000.00 |
| II | GAD/ACC11/2025/DNA-CB /16 | Supply, Installation, Testing, Training & Maintenance of Brand New Genetic Analyzer | 1,000,000.00 |

උපකරණ සඳහා නිර්දේශිත පිරිවිතරයන් (Specifications) අයදුම්පත සමඟ නිකුත් කරනු ලැබේ

3. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) මගින් සිදු කරනු ලැබේ.

4. ලංසු ඉදිරිපත් කිරීම සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසු කරුවන්ට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී ගේ දුරකථන අංක 011-2786396/071-8743677 මගින් අවශ්‍ය වැඩි විස්තර ලබාගත හැකි අතර 2025/08/04 දින සිට 2025/08/22 වැනිදා දක්වා කාලය තුල සතියේ රාජකාරී දිනවල පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල පිහිටි ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේදී ලංසු කැඳවීමේ ලේඛන පරීක්ෂා කර බැලිය හැක. එසේ නැතිනම් govanalyst.finance@gmail.com යන විද්‍යුත් තැපෑල ඔස්සේ ඉල්ලීමක් කිරීම මඟින්ද එම ලියවිලි ලබාගත හැක.

5. ලිඛිත ඉල්ලුම්පතක් රු.12,500/= බැගින් වූ ආපසු නොගෙවන තැන්පතුවක් ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සරප වෙත මුදලින් පමණක් ගෙවීමෙන් අදාල ලංසු කැඳවීමේ ලේඛන කට්ටලයක් 2025/08/04 දින සිට 2025/08/22 දින දක්වා කාලය තුල සතියේ රාජකාරී දින වල පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා ලබා ගත හැක.

6. විද්‍යාගාර උපකරණ සඳහා ලංසු ලේඛන ලබාගැනීමට ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතු වේ.

7. සම්පූර්ණ කරන ලද ලංසු, ආණ්ඩුවේ රස පරීක්ෂක, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයට 2025/08/25 දින නියමිත වෙලාවට හෝ ඊට පෙර භාර දිය යුතුය. සෑම ලංසුවකින්ම අදාල පරිදි ලංසු සුරක්ෂණය සමඟ ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම පහත පරිදි සිදු කරනු ලබන අතර එම අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

I. 2025 /08/ 25 පෙ.ව. 10.45
II. 2025 /08/ 25 පෙ.ව. 11.00

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව,
නො.31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල